**මධ්‍යම පරිසර අධිකාරිය - 2020**

---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මධ්‍යම පරිසර අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාලව පූර්ව කාල පරිච්ඡේද ගිණුමට සිදුකර තිබූ රු.2,778,846 ක් හර කිරීම්ද රු.849,063 ක බැර කිරීම්වලට අදාල ගණුදෙනු අතීතානුයෝගීව ගලපා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 54 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී පූර්ව වර්ෂ තුල සිදු කරනු ලබන ගැලපීම් වලට අදාළ කරුණු නිසි පරිදි හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් කල් බදු පදනම මත ලබාගෙන තිබුණු ඉඩම් පිළිබඳ සියළු විස්තර විගණනයට ඉදිරිපත් නොකළ අතර රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් රු.315,490 වර්ෂික බදු කුලි මත කල්බදු පදනම යටතේ ලබාගත් ඉඩමක විස්තර පමණක් ඉඩම් විස්තර යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද පෙතියාකන්ද | මෙහෙයුම් කල් බදු සම්බන්ධව අදාල කරුණු නිසි පරිදි 2021 වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා රු.2,820,000 ක වාර්ෂික බදු කුලියක් ගෙවීමට යටත්ව බදු පදනම යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මිලියන 47 ක තක්සේරු වටිනාකමකට ලබාගෙන තිබුණු අක්කර 23 රූඩ් 01 පර්චස් 30.45 ක ප්‍රමාණයක ඉඩමේ භුක්තිය 2017 අගෝස්තු 21 දින සිට අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බදු කුලිය රු.9,400,000 ක් විය. එසේ වුවත් මෙම මුදල ගෙවීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර බදු ගැනීම් පිළිබඳ විස්තර කිසිවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාහන වායු විමෝචන අරමුදල මගින් 2018 වර්ෂයේදී රු.82,752,000 ක වටිනාකමකට මිලදී ගන්නා ලද ජංගම සංසරන වායු තත්ත්ව මැනීමේ ඒකක 02 ක් 2020 නොවැම්බර් 20 දින මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාරදී තිබුණි. අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව වත්කමේ ඵලදායී ජීවිත කාලය ගණනය කිරීමේදී වත්කමක් භාවිතයට ගත් දිනය සලකා තිබූ අතර ඒ අනුව මෙම වත්කම සඳහා ද භාවිතයට ගත් දිනයේ සිට ඵලදායී ජීවිත කාලය වර්ෂ 10 ක් ලෙස සලකා ක්ෂයවීම් ගණනය කර තිබුණි. එහෙත් ඉහත තත්ත්වය යටතේ වත්කමේ ඵලදායී ජීවිත කාලය ඇගයීමේදී වත්කම | වාහන විමෝචන අරමුදල මගින් මෙම වායු තත්ත්ව මැනීමේ ඒකක 02 අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා මධ්‍යම පළාත් කාර්යාලයේ 2018 වසරේ දී ස්ථාපිත කල ද අප අධිකාරියට ලිඛිතව භාර දීම (අයිතිය පැවරීම) සිදුවූයේ 2020 නොවැම්බර් 20 වන දින වේ. ඒ අනුව අයිතිය නිසි පරිදි හුවමාරු වූ දින සිට ක්ෂය වීම ගණනය කර ඇත. | වත්කමේ ඵලදායී ජීවිත කාලය නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

භාවිතයට නොගත් කාලය සැලකිල්ලට ගෙන ක්ෂය අනුපාතය ගණනය කර නොතිබුණි.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර තිබුණද පිරිවැය රු.21,727,678 ක මෝටර් බයිසිකල් වලින් එක් මෝටර් බයිසිකලයක් පමණක් රු.10,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේම ඉහත මෝටර් රථ සමඟ රු.500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු ලොරි රථයක ප්‍රත්‍යාගණන වටිනාකම මෝටර් රථ ප්‍රත්‍යාගණන සංචිතයට හා මෝටර් රථ වටිනාකමට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයේ මෝටර් බයිසිකලය පමණක් ප්‍රත්‍යාගණනය කරන ලද අතර පරිපාලන අංශය මගින් අනිකුත් මෝටර් බයිසිකල් ක්‍රියාත්මක තත්වයේ නොපවතින බව දන්වා ඇත. එය තවදුරටත් පරීක්ෂා කර බලා මෝටර් බයිසිකල් සඳහා ප්‍රත්‍යාගන වටිනාකමක් පවතීනම් 2021 වසරේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ එකතුව රු.35,968,846 ක පුනරාවර්තන ප්‍රදාන ආදායමක් ලෙස හඳුනා නොගෙන වගකීම් යටතේ සාවද්‍ය ලෙස දක්වා තිබුණි. | පෙන්වා දී ඇති පුනරාවර්තන ප්‍රදාන ගිණුමේ ශේෂය වන රු.36,120,516 හි වර්ෂ ගණනාවක් සිට පැවත එන ඉතා පැරණි වූ ශේෂයන් පවතී. මෙම අගයන් පිළිබඳ තවදුරටත් ගිණුම් පොත්පත්, ලේඛන පරීක්ෂා කර බලා එවැනි පැරණි ශේෂයන් වාර්ෂික කාර්ය සාධන ප්‍රකාශය තුල ඇතුලත් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ සේවාව(EIA) සැපයීම වෙනුවෙන් ලැබීම් සේවාව අවසන් කරන තෙක් ගෙවිය යුතු මුදල් ලෙස රු.140,432,753 ක් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර ඉන් රු.33,682,272 ක් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණි. මෙම | පාරිසරික බලපෑම් ඇගයීම් ගාස්තු නිරවුල් කළ හැක්කේ අදාල පාරිසරික ඇගයීම් සිදු කර වාර්තා ලබා දීමෙන් අනතුරුවය. මෙම නිරවුල් කිරීම් සඳහා පළාත් මට්ටමින් තොරතුරු කැඳවා එම ව්‍යාපෘතීන් අවසන් කළ හැකිද විමසීම් සිදු කිරීමෙන් අනතුරුව ගාස්තු නිරවුල් කිරීම සිදු වේ. මෙම වර්ෂයේ දී එසේ කිරීමට නොහැකි වුයේ තොරතුරු ලබා ගැනීමේ සිදු වූ | තොරතුරු ලබාගෙන අදාල ගැලපීම් අවසන් ගිණුම්වල සිදුකිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාරිසරික බලපෑම් මඟින් ජනිතවන අධිකාරියේ ආදායම නිශ්චිතව හඳුනාගෙන ආදායම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදයන් නිසා වන නමුදු පෙර වර්ෂ වලදී එම අගයයන් ලබා ගෙන ආදායමට බැර කිරීමට කටයුතු කෙරුණි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩ ඇණවුම් කිරීමකින් තොරව හා වගකීමකින් තොරව රු.18,455,380 ක් මාර්ගස්ථ තොග ලෙස හා ණය හිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | මාර්ගස්ථ තොග හා නිමවෙමින් පවතින වැඩ ගිණුමෙන් දැක්වෙන්නේ ප්‍රාග්ධන ස්වරූපයේ මිළදී ගැනීම් වන අතර ඒ අනුව එම වත්කම් වල අයිතිය තහවුරු වීම හා එම වත්කම් භාවිතයට ගත හැකි තත්ත්වයට පත්වන තෙක් මෙලෙස මාර්ගස්ථ තොග හා නිමවෙමින් පවතින වැඩ (Good in Transit and Work-in Progress) ලෙස ගිණුම් වල පෙන්වයි. ඒ අනුව අදාල වත්කම් හි අයිතිය මාරු වීම සිදුවූ පසු ගෙවීම සිදු කරනු ලබයි. | ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | එකතු කළ අගය මත බදු වගකීම ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් වර්ෂ අවසානයේදී ගෙවිය යුතු බදු වගකීම රු.696,282 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මේ පිළිබඳ නිසි පරිදි ගැලපීම් සිදු කර ගෙවීම් හෝ අය කිරීම් 2021 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරමි. | ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | රත්නපුර කාර්යාල සංකීර්ණයේ සැලසුම් නිර්මාණය සඳහා 2018 වර්ෂයේ දරන ලද රු.1,675,350 ක් නොනිමි වැඩ ලෙස දැක්විය යුතු වුවත් එය ජංගම වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | රත්නපුර කාර්යාල සංකීර්ණයේ සැලසුම් නිර්මාණය සඳහා රු.1,675,350 ක් 2018 වර්ෂයේ ගෙවා තිබුණද, සංකීර්ණය ඉදිකිරීමට මහ භාණ්ඩාගාර ප්‍රතිපාදනය ලැබී නොමැත. එබැවින් එම ප්‍රසම්පාදන කටයුතු ආරම්භය මේ වන තෙක් සිදුව නොමැත. ඒ හේතුවෙන් එම ගෙවීම නොනිමි ලෙස ගිණුම් ගත කිරීමට වඩා කලින් ගෙවීම් ලෙස පෙන්නුම් කිරීම සුදුසුය. එම අනුමැතියන් ලැබීමෙන් පසු ප්‍රසම්පාදනයන් ආරම්භ වූ වහාම එම කලින් ගෙවීම් නොනිමි ගිණුමට මාරු කිරීමට නියමිතය. | ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) අධිකාරිය විසින් අවසාන ගිණුම්වලට අදාල ශේෂ පරික්ෂුම පිළියෙල කිරීමේදී හඳුනානොගත් ගිණුමකට අයත් රු.6,000,000 ක අගයක් ශේෂයක් ලෙස සලකා තුලනය කර තිබුණද ඒ සඳහා අවශ්‍ය තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරිපත් කරන ලද 2020 ශේෂ පිරික්සුම තුල රුපියල් 6,000,000 ශේෂ පිරික්සුම තුල හඳුනානොගත් ගිණුමක් නොපවතී. | එක් එක් ශේෂයන්ට අදාල තහවුරු කිරීම් ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | | | |
| i. (7) වගන්තිය | පාරිසරික සභාව සඳහා පත්කරන ලද සියලු සාමාජිකයන් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් සඳහා සහභාගි වී නොතිබුණි. මේ අනුව පාරිසරික සභාව පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමාජිකයන්ගේ දායකත්වය ලබාදී නොතිබුණි. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව, මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම්, බලතල, කාර්යභාරය සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධව අධිකාරියට උපදෙස් දීම හා අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකරණයට උපදෙස් දීම යන අරමුණු පෙරදැරිව පරිසර සභාව පිහිටුවා ඇත.<br>පනත ප්‍රකාරව ඒ සඳහා සාමාජිකයින් 30 ක් ගරු පරිසර අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් පත්කරනු ලැබේ. පසුගිය 2020 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ 13වන | පාරිසරික සභාව සඳහා සියලු සාමාජිකයන්ගේ දායකත්වය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | පරිසර සහා සැසිවාරය සඳහා ද සාමාජිකයින් 27කින් සමන්විත වූ පරිසර සහාව ආරම්භ කරන ලදී.<br>□2020 වර්ෂයේ දී ලොව පුරා covid 19 ව්‍යාප්ත වීමත් සමඟ මාර්තු මස 13වන දින සිට දිවයින පුරා වරින් වර රට වසා තැබීම (lockdown) එම වසර තුළ සහාවාර කැඳවීම අවම වීමට හේතු විය. | |
| ii. | (7) වගන්තිය | (3) | ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ ස්ථාපිත ජාතික පාරිසරික සභාවේ කර්තව්‍යන් දක්වා ඇති අතර ජාතික පාරිසරික සභාවේ සාකච්ඡාවට භාජනය වූ පහත විශේෂ කරුණු සම්බන්ධයෙන් විගණිත දිනය වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>a. කටුපොල් කලමනාකරණ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් යෝජිත ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරිම.<br>b. පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයන් සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රය ලබාදීමේදී ඩෙසිබල් ප්‍රමාණය ඇතුලත් කොන්දේසියක් ඇතුලත් කිරිම.<br>c. වායු විමෝචන තත්ව පරික්ෂා කරන යන්ත්‍රවල පිරිවැය දේශීයව දැරිය නොහැකිනම් ඒ සඳහා | කටුපොල් සම්බන්ධව මෙම වර්ෂය තුලදී පහත සහන් ක්‍රියාමාර්ග ගන්නා ලද බව දන්වමි.<br>• කටුපොල් වගාකර ඇති ඉඩම් වලින් කටුපොල් ක්‍රමානුකූලව ඉවත් කර රබර් හෝ වෙනත් ජල පෝෂිත තත්වයන් ආරක්ෂා වන වගාවන් ස්ථාපනය කරන ලෙස 2021 අප්‍රේල් 27 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සැලසුම් කිරීම සම්බන්ධීකරණය උදෙසා අදාල ආයතන වල සහභාගීත්වයෙන් මූලික රැස්වීමක් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අනෙකුත් ආයතනවල නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2021 මැයි 03 දින මධ්‍යම පරිසර | පාරිසරික කරුණු සම්බන්ධයෙන් අදාල තීරණ කාලීනව ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කටයුතු ඉටුකිරිමට අවශ්‍ය පියවර ගැනිම. | අධිකාරියේදී පවත්වන ලදී.<br>• අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට උක්ත රැස්වීමේදී තිරණය විය.<br>• 2020 මැයි 11 දින පරිසර සහ වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ සම සභාපතිත්වයෙන් හා අදාළ අනෙකුත් ආයතනවල නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුවේ ප්‍රථම රැස්වීම පැවැත්වීමට පරිසර අමාත්‍යාංශය විසින් කටයුතු සූදානම් කරන ලදී. රට තුල පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පරිසර අමාත්‍යාංශය විසින් එම රැස්වීම අවලංගු කරන ලද අතර ඉදිරියේදී එය පැවැත්වීමට නියමිතය.<br>b. පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදන ආයතන සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීමේදී ශබ්ද දූෂණය පාලනය කිරීම සඳහා දැනටමත් ඩෙසිබල් ප්‍රමාණය ඇතුලත් කොන්දේසි ඇතුලත් කෙරේ. එසේම මේ සම්බන්ධව තව දුරටත් ක්‍රියාත්මක වන ලෙසට පළාත් කාර්යාල දැනුවත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. c.දක්වා ඇති කරුණු නිවැරදි වේ. වායු විමෝචන තත්ව පරීක්ෂා කරන යන්ත්‍ර වල සේවා නඩත්තුව සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | |
| | iii. 23(ජ)(2) වගන්තිය | ශබ්ද දූෂණය පාලනය සම්බන්ධයෙන් රෙගුලාසි සංශෝධනය කර නොතිබුණි. | දක්වා ඇති කරුණු නිවැරදිය. දැනට මධ්‍යම පරිසර අධිකාරිය ශබ්ද දූෂණ පාලන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා බාහිර උපදේශකයකු පත්කරගෙන අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | |
| (ආ) | 2003 ජුනි 06 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 වගන්තිය | 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුගත කිරීමට පෙර ගරු අමාත්‍යතුමාගේ නිර්දේශය ලබාගැනීමේ සාකච්ඡාව සඳහා දිනයක් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කර ඇත. 2019 වාර්ෂික වාර්තාවේ සිංහල පිටපත් 5 ක් 2021 මාර්තු 23 දින අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී. | වාර්ෂික වාර්තාව නියමිත කාලය තුළ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 15 දිනැති අංක DMA/SP/2015/01 දරන කළමනාකරණ විගණන | භාණ්ඩ සමීක්ෂණයේදී අනිකුත් වත්කම් මෙන්ම වාහන පිළිබඳවද භෞතික පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත්, වාහන පිළිබඳ වත්කම් ලේඛනයට අනුව සියළු වාහන භෞතික | 2020 වර්ෂයේ සිට නියමිත පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී වාහන පිළිබඳ භෞතික පරීක්ෂාව සිදු කරනු ලබයි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තු චක්‍රලේඛය | පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | 2008 ජනවාරි 26 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 18 ක ස්ථාපනය කර තිබූ වායු විමෝචන මධ්‍යස්ථාන 83 ක් 2020 දෙසැම්බර් 31 දිනට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයකින් තොරව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ වායු විමෝචන මධ්‍යස්ථාන 26 න් 23ක් සඳහාම වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ දත්ත පද්ධතිය අනුව අලුතින් හඳුනාගන්නා ලද, කර්මාන්ත පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියට යටත් කර්මාන්ත ලෙස වර්ග කර ඇත. එම කර්මාන්ත NP (New Processing) යටතට අයත් වන අතර 2020 වර්ෂයේදී එවැනි කර්මාන්ත 1078 ක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියවලියට යොමු කර බලපත්‍ර ලබාගැනීම සඳහා ඒ වන විට ක්‍රියාත්මක වී ඇත. | වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කාලීන සමාලෝචනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.135,512,005 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.71,973,628 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.63,538,377 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් මෙහෙයුම් අදායම්වල අඩුවීමක් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපද්‍රව්‍ය කලමනාකරණ අංශය 2004 වර්ෂයේ සිට ආරම්භ වීමත් සමඟ විවිධ පාර්ශවයන් විසින් පරිත්‍යාග කර තිබූ කොම්පෝස්ට් බඳුන් විකිණීම මත ලැබූ මුදල රු.7,887,531 ක් කොම්පෝස්ට් බඳුන් සංචිතය ලෙස පවත්වා ගෙන ගොස් තිබුණි. මෙම සංචිතයේ අරමුදල් භාවිතා කරමින් නැවත ජනතාව වෙත කොම්පෝසට් බඳුන් ලබා දීමේ වැඩපිළිවෙලක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | පසුගිය ගිණුම් පරීක්ෂාවෙන් කොම්පෝස්ට් බඳුන් සංචිතය 2004 වර්ෂයේ සිට අපද්‍රව්‍ය කළමණාකරන අංශය ආරම්භ වීමත් සමඟ විවිධ පාර්ශවයන් විසින් ලැබූ කොම්පෝස්ට් බඳුන් (පරිත්යාග) විකිනීම මත ලැබූ මුදලකි. එය පිළිසරු ව්‍යාපෘතිය මත වන අරමුදලක් නොවන අතර තවදුරටත් ගිණුම් පරීක්ෂාවෙන් පසු 2021 වර්ෂයේ මෙම ගිණුමට ගැලපීම් කිරීමට කටයුතු කරමි. | අරමුදල් ඌන උපයෝජිතව තබා නොගතයුතු අතර අදාල ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (ආ.ආ) (1) හා (2) යන උපවගන්ති අනුව යම් ව්‍යාපෘතියක මූලික පාරිසරික පරික්ෂණ සම්බන්ධයෙන් මහජන අදහස් දැක්වීම සඳහා අවස්ථාව ලබා දිය යුතු වුවත් පෙතියාකන්ද කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් මහජන අදහස් දැක්විම සඳහා අවස්ථාව ලබාදී නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන ලද අවස්ථාවේ ඇති වූ මහජන විරෝධතා හේතුවෙන් රු.154,138,405 ක් වියදම් | මීතොටමුල්ල කසළ කන්ද නායයාමත් සමඟ ගම්පහ දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කඩිනමින් ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතිය යටතේ පළමුවෙන්ම කාබනික පොහොර අංගනය ඉදි කරන ලදී. ඒ සඳහා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයට අනුව පාරිසරික නිර්දේශයක් ලබාගෙන ඇත. ඒ සඳහා මහජන විමසීමක් සිදු නොවේ. මෙම කාබනික පොහොර අංගනයේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් පසු | වත්කම් උපරිම කාර්යක්ෂම අයුරින් භාවිතයට යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර ඉදිකරන ලද කොම්පෝස්ට් අංගනය විගණිත දිනය වන විටත් නිශ්කාර්යව පැවතුණි. | මෙහෙයුම් කටයුතු සඳහා බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය වෙත භාරදෙන ලදී. | |
| (ආ) රු.මිලියන 600 ක් වැයකර ඉදිකර තිබූ දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම සම්බන්ධයෙන් ලබාදී තිබූ තාක්ෂණික කරුණු අනුව කටයුතු නොකිරීම හේතුවෙන් කසල රඳවනය ඇතුළත තිබූ Geotextile ආවරණය නැවත ප්‍රතිස්ථාපනය කිරිම සඳහා රු.2,577,081 ක වියදමක් දැරීමට සිදු වී තිබුණි. තවද මෙම බිම් පිරවුමේ දෛනික ධාරිතාවය මෙට්‍රික් ටොන් 90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් ටොන් 7,956, 1,437 හා 2,284 ක අවම ධාරිතාවයකින් කසල ලබාගැනීම් සිදුකර තිබුණි. | කසල අවම ධාරිතාවකින් තැන්පත් කිරීමට සිදු වීම හේතුකොට ගෙන මෙම සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර සැපයූ KOICA ආයතනයේ මෙම ව්‍යාපෘතිය සඳහා ඉතිරිව පැවති මුදල්වලින් මධ්‍යම පරිසර අධිකාරිය සහ KOICA ආයතනය ගනු ලැබූ තීරණ අනුව පරිශ්‍රය තුල පුහුණුවක් සහ සනීපාරක්ෂක බිම් පිරවුමේ පවතින අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට තීරණය කෙරුණි. එම තීරණය මත සනීපාරක්ෂක බිම් පිරවුමෙහි geotextile ස්ථරය අලුත්වැඩියා කටයුතු කර ගැනීම, අප අපජල පිරිපහදු පද්ධතිය පවතින ගැටළු නිරාකරණය කර ගැනීමත් එමෙන්ම විශේෂඥයින් ලවා සනීපාරක්ෂක බිම් පිරවුම කාර්ය මණ්ඩලය පුහුණු කිරීමක් ආදී සියලු කටයුතු සමඟින් අලුත්වැඩියා කොට මධ්‍යම පරිසර අධිකාරියට බාර දීමත් සිදු වුණි. | වත්කම් ඌන උපයෝජිතව නොතිබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල ණය ගිවිසුම් අංක SRI – 21 යටතේ ක්‍රියාත්මක වූ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දිනය වන විට දරා ඇති වියදම රු.මිලියන 466 කි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේ තෝරාගත් | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සංවර්ධන ඉලක්ක සපුරාලනු වස් අනුරාධපුර කිරික්කුලම හා ගාල්ල මොන්රොවියවත්ත පිළිසරු ව්‍යාපෘතිය මඟින් නිර්මාණය කර පළාත් පාලන ආයතන වෙත භාර දීමට කටයුතු කරනු ලැබූ මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයන්ගේ | නව විෂයපථය හඳුනාගනිමින් ව්‍යාපෘති අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

කොන්ත්‍රාත්කරුගේ ලංසු සුරක්ෂණය පිළිබඳ ඇතිවූ විරෝධතාවයක් හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර නොතිබීමත්, ඉදිකිරීම් සඳහා තෝරාගත් ස්ථාන වෙනස් කිරීමත් හා ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම යන හේතු මුල්කර ගනිමින් මෙම ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසාන කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

දිගුවක් ලෙස එම ව්‍යාපෘතිය භූමී තුළම සනීපාරක්ෂක බිම් පිරවුම් දෙකක් නිර්මාණය කිරීමටත්, මූලික සැලසුම්වල දී යෝජනා කරන ලද මහනුවර ගෝනාදිගවත්ත හා පානදුර මාලමුල්ල ව්‍යාපෘති භූමී වෙනුවට යෝජනා වූ විකල්ප ව්‍යාපෘති භූමී වශයෙන් පිළිවෙලින් යාපනය කීරමලේ හා පොළොන්නරු මීගස්වැව ව්‍යාපෘති භූමි තුළ තවත් සනීපාර්කෂක බිම් පිරවුම් දෙකක් නිර්මාණය කිරීමටත් සැලසුම් සකස් කර තිබුණි.

2013 ජුලි 23 අත්සන් කරන ලද ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ සියලු කටයුතු මාස 48 ක් තුළ අවසන් වීමට නියමිතව තිබුණි. මහනුවර ගෝනාදිගවත්ත හා පානදුර මාලමුල්ල ව්‍යාපෘති භූමී වෙනුවට විකල්ප ව්‍යාපෘති භූමී සොයා ගැනීමට හා සොයාගත් එම විකල්ප භූමී සඳහා වූ සැලසුම් සකස් කිරීමට අමතර කාලයක් ගත විය. තවද සියලුම සැලසුම් අවසන් කිරීමෙන් පසු 2017 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද සිවිල් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වීම හේතු කොටගෙන 2020 ජූලි දක්වා ව්‍යාපෘතියේ වැඩ සැලසුම් කළ පරිදි අවසන් කිරීමට නොහැකි විය.

2020 ජුලි 01 දින අමාතය මණ්ඩලය ලබා දුන් තීරණයට අනුගත වෙමින් ඔක්තෝම්බරි 31 දින මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් ආසන්න වශයෙන් පළාත් පාලන ආයතන 33 කට දෛනික නාගරික කසළ මෙට්‍රික් ටොන් 123 ක් පරිසර හිතකාමී ලෙස බැහැරලීමේ අවස්ථා අහිමි වී ගොස් ඇත.

මෙම ව්‍යාපෘතිය දරා ඇති වියදම රු.450,278,338 ක් වේ.

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ රු.8,028,200 කට මිලදී ගන්නා ලද කම්පන විශ්ලේෂණ යන්ත්‍රය වර්ෂයක් වූ වගකීම් කාලය තුළ ක්‍රමාංකනය කළ යුතු වුවත් 2021 ජුනි වන විටත් එසේ සිදුකර නොතිබුණි. එසේ තිබියදී උපකරණය මිලදී ගැනීමෙන් පසුව පරීක්ෂණ වාර 04 ක් පමණක් සම්පූර්ණ කර තිබුණු අතර ක්‍රමාංකනය නොකිරීම නිසා නිශ්කාර්යව පැවතුණි. 2018 වර්ෂයේදී නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවේ 5(2)(1)(ඇ) ඡේදයෙහි සඳහන්ව ඇති ප්‍රසම්පාදන දුර්වලතාවය තවදුරටත් මෙමඟින් තහවුරු වී තිබුණි. | ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සහිතව 2017 නොවැම්බර් 20 දින Richy Project (Pvt) Ltd ආයතනය මඟින් මෙම කම්පන විශ්ලේෂණ උපකරණ මිල දී ගන්නා ලදී.<br>2018 නොවැම්බර් 08 දින සිට Richy Project (Pvt) Ltd ආයතනය තාවකාලික ව වසා ඇති බැවින් මෙම උපකරණය ක්‍රමාංකනය (Calibration) සම්බන්ධව ගැටළුවක් පැන නැගුණි.<br>එම උපකරණය මිල දී ගැනීමේ දී Richy Project (Pvt) Ltd ආයතනය නිර්දේශ කිරීම සම්බන්ධයෙන් ගැටළු ඇති වූ බැවින් විමර්ශන කටයුතු සඳහා අදාල ලිපි ගොනුව අධිකාරියේ විගණන අංශය මඟින් කිහිප වරක් රැගෙන ගොස් ඇත.<br>2020 හා 2021 වර්ෂයන්හි පැවති කොවිඩ් වසංගතය තත්වය මත කාර්යාල වරින් වර වසා දැමීම හේතුවෙන් ක්‍රමාංකන කටයුතු කිරීම තව දුරටත් ප්‍රමාද වී ඇත.<br>Richy Project (Pvt) Ltd ආයතනය වසා ඇති බව සනාථ කිරීමට අදාල නීත්‍යානුකූල ලිපියෙහි පිටපතක් අධිකාරිය වෙත ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.<br>මෙම උපකරණයේ ක්‍රමාංකනය සියළු බදු සහිතව රු.412,500 ක ඇස්තුමේන්තුවක් ලබා දී ඇති නමුත් මෙම උපකරණ මිල දී ගැනීමේ දී එහි පළමු ක්‍රමාංකනය Richy Project (Pvt) Ltd ආයතනය මඟින් සිදු කරන බව සඳහන් කර ඇත. ඒ සම්බන්ධව එම ආයතනය සමඟ සාකච්ඡා කිරීමට අදහස් කර ඇත.<br>මෙම උපකරණයේ ක්‍රමාංකන කටයුතු සිදු කළ පසු කම්පන දූෂණය හා සම්බන්ධ පරීක්ෂණ කටයුතු සඳහා භාවිත කර ඒ තුලින් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂිතය. | වත්කම් භාවිතයට ගැනීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |